# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**1890/16 – 2014 නොවැම්බර් 26 වැනි බදාදා – 2014.11.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගලසියපත්තුව සුළු කොට්ඨාසයේ උක්ගහකුඹුර ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක මහ/පීජේපී/2013/1583 හා 2013.11.30 වැනි දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණවලින් යුත් ඉඩමට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – කුරුඳුවත්තේ හේන – ප්‍රමාණය: හෙක්. 0.0174**
උතුරට: ඇළ සහ ඩී. ටී. කමලාවතී හිමිකම් කියන කුරුඳුවත්තේ හේන; නැගෙනහිරට: ඩී. ටී. කමලාවතී හිමිකම් කියන කුරුඳුවත්තේ හේන සහ මහ/මාරතුගොඩ මධ්‍ය මහා විද්‍යාලය හිමිකම් කියන නම නොදන්නා ඉඩම; දකුණට: මහ/මාරතුගොඩ මධ්‍ය මහා විද්‍යාලය හිමිකම් කියන නම නොදන්නා ඉඩම සහ ඇළ; බටහිරට: ඇළ.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය .

යොමු අංකය: 4-3/8/2013/පීසී/53.
2014 සැප්තැම්බර් මස 26 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

12 - 379